1978 - 8 - 14

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 34 දරන පෙරලා සියරට යවනු ලබන ඉන්දියානුවන්ට පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 අගෝස්තු මස 04 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක

මිල : ශත 55 යි

තැපැල් ගාස්තුව : ශත 15 යි

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 34 දරන පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවන්ට පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමේ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 46/77.

පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවන්ට පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 34 දරන පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවන්ට පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමේ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවන්ට පාරිතෝෂික ගෙවීම සම්බන්ධයෙන් සේවායෝජකයාගේ බැඳීම.**

2. (1) පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකු අවුරුදු පහකට නොඅඩු කාල සීමාවක් සඳහා යම් වත්තක—

(අ) කම්කරුවකු ලෙස, හෝ

(ආ) කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ලෙස,

සේවයෙහි නියුක්ත කර ගත් සෑම සේවායෝජකයකු ම විසින්, අවස්ථාවෝචිත පරිදි කම්කරුවකු ලෙස හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු ලෙස හෝ ඒ සේවායෝජකයා යටතේ වූ ඔහුගේ සේවාවන් වෙනුවෙන් මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ප්‍රමාණ අනුව ආගණනය කරන ලද පාරිතෝෂිකයක් ඒ පෙරළා සියරට යවනු ලබන්නාට ගෙවනු ලැබිය යුතු ය.

(2) මේ පනත ආරම්භ වන දින හෝ එදිනට පෙර එවැනි සේවායෝජකයකු විසින් එම සේවාවන් වෙනුවෙන් පාරිතෝෂිකයක් ගෙවනු ලැබ ඇති පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට හෝ පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකු සම්බන්ධයෙන් හෝ (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවන්නේ ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට ලැබිය යුතු යම් පාරිතෝෂික ගෙවීමක් ලබා ගැනීමට පෙර ඒ පෙරළා සියරට යවනු ලබන්නා මිය ගියහොත්, ඒ පෙරළා සියරට යවනු ලබන්නා සේවක අර්ථ සාධක අරමුදලේ දායකයකුව සිටියේ නම් සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 24 වන වගන්තියෙහි සඳහන් මුදල එම වගන්තිය යටතේ ලැබීමට හිමිකම් ලැබෙන්නට තිබුණු තැනැත්තාට හෝ තැනැත්තන්ට හෝ ඒ ගෙවීම කරනු ලැබිය යුතු ය.

පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවන්ට කාර්මික ආරාවුල් පනතේ 31ආ(1)(ආ) වන වගන්තිය අදාළ නොවිය යුතු බව.

3. යම් වත්තක සේවයෙහි නියුක්ත කම්කරුවකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු වන පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට හෝ ඔහු වෙනුවෙන්, ඔහු සාමාජිකත්වය දරන වෘත්තීය සමිතියකට පාරිතෝෂික හෝ වෙනත් ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් පිහිටක් හෝ සහනයක් සඳහා කාර්මික ආරාවුල් පනතේ 31ආ (1) (ආ) වන වගන්තිය යටතේ ඉල්ලීමක් කිරීමේ හිමිකම් නොමැත්තේ ය.

විනිශ්චයට භාජනව ඇති කාර්මික ආරාවුල් පනතේ 31ආ(1)(ආ) වන වගන්තිය යටතේ වූ ඉල්ලීම්.

4. (1) යම් වත්තක සේවයෙහි නියුක්ත, කම්කරුවකු හෝ කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු හෝ වන පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකු විසින් හෝ, ඔහු වෙනුවෙන්, ඔහු සාමාජිකත්වය දරන වෘත්තීය සමිතියක් විසින් හෝ, මේ පනත ආරම්භ වන දින හෝ එදිනට පෙර පාරිතෝෂික හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන්, කාර්මික ආරාවුල් පනතේ 31ආ(1)(ආ) වන වගන්තිය යටතේ කම්කරු විනිශ්චය අධිකාරයක් වෙත කරනු ලබන සෑම ඉල්ලීමක් ම, එම ඉල්ලීම මත තීරණයක් කිරීමට පෙර ඕනෑම අවස්ථාවක ඒ පෙරළා සියරට යවනු ලබන්නා විසින් හෝ ඒ වෘත්තීය සමිතිය විසින් මෝසමක් මඟින් ඉල්ලා අස් කර ගත හැකි අතර, ඒ විනිශ්චය අධිකාරය විසින් එම මෝසමට ඉඩ දෙමින් ආඥාවක් කළ යුතු ය.

(2) ඉල්ලීමක් ඉල්ලා අස් කර ගැනීම සඳහා වූ මෝසමකට ඉඩ දෙමින් (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් කර තිබෙන අවස්ථාවක, කම්කරු විනිශ්චය අධිකාරය වෙත ඒ ඉල්ලීම කරනු ලැබුවේ යම් පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකු සම්බන්ධයෙන් ද ඒ පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවා සම්බන්ධයෙන්, මේ පනතේ පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවීමට අදාළ විධිවිධාන අදාළ වන්නේ ය; තව ද ඒ අනුව පෙරළා සියරට යවනු ලබන්නාට ලැබිය යුතු පාරිතෝෂික සහ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය සේවායෝජකයා විසින් එකී ආඥාවෙහි දින සිට සති දෙකක් ඇතුළත ඔහු වෙත දනුම් දිය යුතු ය.

ලැබිය යුතු මුදල් ද ගෙවීම කළ යුත්තේ යම් කාල සීමාවක් තුළ ද ඒ කාලසීමාව ද සේවායෝජකයා විසින් දනුම් දිය යුතු බව.

5. 2 වන වගන්තියේ විධිවිධාන අදාළ වන පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුගේ සෑම සේවායෝජකයකු ම විසින්—

(අ) ඒ පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවාට සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ ලැබිය යුතු ප්‍රතිලාභ ගෙවීම සඳහා සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 23 වන වගන්තිය යටතේ ඒ සේවායෝජකයා විසින් හිමිකම් පෑමක් සහතික කරනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත නැතහොත් ඒ පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවා විසින් මේ පනත ආරම්භ වන දිනයෙහි හෝ ඒ දිනයට කලින් ඒ හිමිකම් පෑම කර තිබෙන හෝ ප්‍රතිලාභ ලබා තිබෙන අවස්ථාවක මේ පනත ආරම්භ වන දින සිට සති දෙකක් ඇතුළත ඒ පෙරළා සියරට යවනු ලබන්නාට ලැබිය යුතු පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණයත් දනුම් දිය යුතු ය; තව ද

(ආ) ඒ පෙරළා සියරට යවනු ලබන්නාට ලැබිය යුතු පාරිතෝෂික සහ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ තමාගේ වත්කම් හෝ තම පවුලේ වත්කම් පැවරීම සඳහා ඔහු විසින් විනිමය පාලකයාගෙන් ලත් බලපත්‍රයක් ඉදිරිපත් කරනු ලබන දිනයෙහි සිට සති දෙකක් ඇතුළත ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

අත්තිකාරම් ගිණුම් අරමුදල.

6. (1) මේ පනතේ කාර්ය සඳහා "අත්තිකාරම් ගිණුම් අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර—

(අ) මේ පනතේ කාර්ය සඳහා ඒ අරමුදලට ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබන මුදල් කිසිවක් ; සහ

(ආ) මේ පනතේ විධිවිධාන යටතේ තේ කොමසාරිස්වරයාගෙන් සහ රබර් පාලකගෙන් කොමසාරිස්වරයා වෙත ලැබෙන මුදල් කිසිවක්

ඒ අරමුදලට ගෙවිනු ලැබිය යුතු ය.

(2) අත්තිකාරම් ගිණුම් අරමුදලේ පාලනය සම්බන්ධයෙන් කොමසාරිස්වරයා වගකිව යුතු ය.

කොමසාරිස්වරයාගේ සහතිකය.

7. (1) පාරිතෝෂික හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ගෙවනු ලැබීම සඳහා, පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකු විසින් හෝ ඔහු වෙනුවෙන් වෘත්තීය සමිතියක් විසින් හෝ ඉල්ලීමක් කරනු ලැබූ විට, අවශ්‍ය යයි කොමසාරිස්වරයා සලකන යම් විභාගයකින් පසු, යම් පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට ලැබිය යුතු පාරිතෝෂික හෝ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය මේ පනතින් නියම කොට ඇති පරිදි, ඒ පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවාට දැනුම් දීම යම් සේවායෝජකයකු විසින් පැහැර හැර ඇති හෝ ප්‍රතික්ෂේප කර ඇති බවට, නැතහොත් වැරදි ප්‍රමාණයක් දැනුම් දී ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත් වන අවස්ථාවක, කොමසාරිස්වරයා විසින්, ඒ පෙරළා සියරට යවනු ලබන්නාට ඒ සේවායෝජකයාගෙන් ලැබිය යුතු පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය සඳහන් කරමින් සහතිකයක් නිකුත් කළ යුතු ය. ඒ සහතිකයේ පිටපතක් ඒ පෙරළා සියරට යවනු ලබන්නා වෙත සහ ඔහුගේ සේවායෝජකයා වෙත තැපෑලෙන් යවනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද සහතිකයෙහි ඇතුළත් යම් ප්‍රකාශයක නිරවද්‍යතාව හෝ එවැනි සහතිකයක් නිකුත් කිරීමෙහි ලා කොමසාරිස්වරයාගේ බලය රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් කිසිම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී හෝ ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ මේ පනතින් නියම කොට ඇති පරිදි, යම් පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට ලැබිය යුතු පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය ගෙවීම යම් සේවා යෝජකයකු විසින් පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ඒ පාරිතෝෂික හා වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය අත්තිකාරම් ගිණුම් අරමුදලින් ඒ පෙරළා සියරට යවනු ලබන්නාට ගෙවීමේ ද, ඒ පෙරළා සියරට යවනු ලබන්නාගේ සේවායෝජක සහ අවස්ථාවෝචිත පරිදි තේ කොමසාරිස්වරයාට හෝ රබර් පාලකට ඒ ගෙවීම දැනුම් දීමේ ද බලය කොමසාරිස්වරයාට ඇත්තේ ය.

(4) පෙරළා සියරට යවනු ලබන යම් ඉන්දියානුවකුට කොමසාරිස්වරයා විසින් (3) වන උපවගන්තිය යටතේ අත්තිකාරම් ගිණුම් අරමුදලින් යම් ගෙවීමක් කරනු ලබන අවස්ථාවක, ඒ පෙරළා සියරට යවනු ලබන්නාට කොමසාරිස්වරයා විසින් එසේ ගෙවන ලද මුදලින් සියයට පණහක් නොඉක්මවන්නා වූ කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන මුදලක අධිභාරයක් ඒ ගෙවීම වෙනුවෙන් කොමසාරිස්වරයා වෙත ගෙවීමට ඒ පෙරළා සියරට යවනු ලබන්නාගේ සේවායෝජකයා යටත් වන්නේ ය.

(5) (3) වන උපවගන්තිය යටතේ පෙරළා සියරට යවනු ලබන යම් ඉන්දියානුවකුට කොමසාරිස්වරයා විසින් යම් ගෙවීමක් කරනු ලබන අවස්ථාවක, ඒ ගෙවීම ද ඒ පෙරළා සියරට යවනු ලබන්නාගේ සේවායෝජකයා විසින් ඒ ගෙවීම වෙනුවෙන් ගෙවනු ලැබිය යුතු අධිභාරය ද ඒ සේවායෝජකයාට සහ අවස්ථාවෝචිත පරිදි තේ කොමසාරිස්වරයාට හෝ රබර් පාලකට හෝ කොමසාරිස්වරයා විසින් දැනුම් දිය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ වූ දැනුම්දීමක් කොමසාරිස්වරයාගෙන් ලැබුණු අවස්ථාවක, පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට පාරිතෝෂික වශයෙන් ගෙවනු ලබන මුදල ලෙස ද ඒ මත ගෙවනු ලැබිය යුතු අධිභාරය ලෙස ද ඒ නිවේදනයෙහි සඳහන් මුදල් ප්‍රමාණයන්, ඒ පෙරළා සියරට යවනු ලබන්නාගේ සේවායෝජකයාට අවස්ථාවෝචිත පරිදි ප්‍රාග්ධන අරමුදල යටතේ නැතහොත් රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල යටතේ ගෙවනු ලැබිය යුතු යම් මුදලකින් කොමසාරිස්වරයාට ගෙවීමේ බලය අවස්ථාවෝචිත පරිදි තේ කොමසාරිස්වරයාට හෝ රබර් පාලකට හෝ ඇත්තේ ය.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කරනු ලැබූ නැතහොත් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබූ වතුවල සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටි පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවන්ට ලැබිය යුතු ගෙවීම්.

8. (1) පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකු සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටි වත්තක් ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු කරනු ලැබ ඇති හෝ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබ ඇති හෝ අවස්ථාවක, ඒ සතු කර ගැනීමේ හෝ අත්කර ගැනීමේ හෝ දිනයට පෙරාතුව ඒ සේවායෝජකයා යටතේ වූ ස්වකීය සේවාවන් වෙනුවෙන් ඒ පෙරළා සියරට යවනු ලබන්නාට ඒ සේවායෝජකයාගෙන් ලැබිය යුතු පාරිතෝෂික සහ වෙනත් මූල්‍ය ප්‍රතිලාභ ප්‍රමාණය සඳහන් කරමින් සහතිකයක්, අවශ්‍ය යයි තමා සලකන පරීක්ෂණයකින් පසු, කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයේ යම් ප්‍රකාශයක නිරවද්‍යතාව හෝ ඒ සහතිකය නිකුත් කිරීමට කොමසාරිස්වරයාට ඇති බලය රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ කිසිම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී හෝ ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට ඔහුගේ සේවායෝජකයාගෙන් ලැබිය යුතු මුදල සඳහන් කරමින් (1) වන උපවගන්තිය යටතේ සහතිකයක් කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලබන අවස්ථාවක, ඒ පෙරළා සියරට යවනු ලබන්නා විසින් සිය වත්කම් හෝ සිය පවුලේ වත්කම් පැවරීම සඳහා විනිමය පාලකගෙන් බලපත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ පසුව, අවස්ථාවෝචිත පරිදි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් නැතහොත් අත්කර ගැනීමේ නිලධරයා විසින්, කොමසාරිස්වරයා මගින්, එසේ සහතික කරනු ලැබ තිබිය හැකි මුදල ඒ පෙරළා සියරට යවනු ලබන්නාට ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් සහතිකයේ පිටපතක්, ඒ සහතිකය නිකුත් කරනු ලැබූයේ යම් පෙරළා සියරට යවනු ලබන්නකු සම්බන්ධයෙන් ද ඒ පෙරළා සියරට යවනු ලබන්නාගේ සේවායෝජකයා වෙත කොමසාරිස්වරයා විසින් යවනු ලැබිය යුතු ය.

(5) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් හෝ අත්කර ගැනීමේ නිලධරයා විසින් හෝ පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට, මේ පනතේ විධිවිධාන යටතේ ගෙවන ලද මුදල, ඒ පෙරළා සියරට යවනු ලබන්නාගේ සේවායෝජකයා වෙත අවස්ථාවෝචිත පරිදි ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 32 වන හා 42ඒ වන වගන්ති යටතේ හෝ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 17 වන වගන්තිය යටතේ හෝ ගෙවනු ලැබිය යුතු වන්දි මුදල කෙරෙහි ප්‍රථම වැය බරක් විය යුතු අතර ඒ මුදල, ඒ සේවායෝජකයා වෙත ප්‍රදානය කරනු ලබන වන්දි මුදලේ ප්‍රමාණයෙන් අඩු කර ගත යුතු ය.

ඇතුළු වීමට හා පරීක්ෂා කිරීමට කොමසාරිස්වරයා සතු බලය.

9. (1) කොමසාරිස්වරයාට—

(අ) පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවන්ට අදාළ යම් නාම ලේඛනයක් හෝ වාර්තාවක් පරීක්ෂා කිරීමේ හෝ මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කරනු ලැබේ දැයි නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවන් සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින යම් වත්තකට දවල් කාලයේ හෝ රාත්‍රි කාලයේ සියලු යුක්තිසහගත වේලාවන්හි දී ඇතුළු වී ඒ වත්ත පරීක්ෂා කිරීමේ බලය ඇත්තේ ය;

(ආ) තමා ඒ ස්ථානය පරීක්ෂා කරන විට එවැනි යම් වාර්තාවක් හෝ නාම ලේඛනයක් පරීක්ෂණය සඳහා නොමැති අවස්ථාවක, කොමසාරිස්වරයා විසින් නියම කරනු ලබන යම් පසු දිනයක ඒ ස්ථානයේ දී පරීක්ෂණය සඳහා එම නාම ලේඛනය හෝ වාර්තාව ඉදිරිපත් කරන ලෙස නියම කිරීමේ බලය ඇත්තේ ය;

(ඇ) එවැනි යම් සම්පූර්ණ නාම ලේඛනයක හෝ වාර්තාවක හෝ එහි යම් කොටසක හෝ පිටපත් ගැනීමේ බලය ඇත්තේ ය;

(ඈ) මේ පනත යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීමේ සහ කාර්ය ඉටු කිරීමේ කාර්යය සඳහා තමාට අවශ්‍ය සියලු තොරතුරු සපයන ලෙස සේවායෝජකයාට විධාන කිරීමේ බලය ඇත්තේ ය; තව ද ඒ විධානය අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ යුතුකම වන්නේ ය; සහ

(ඉ) මේ පනතේ කාර්ය සඳහා අවශ්‍ය යයි තමා සලකන විමසීම් කිරීමේ බලය ඇත්තේ ය.

(2) මේ පනත යටතේ වූ යම් විමසීමක කාර්ය සඳහා—

(අ) සියලු සාක්ෂිකරුවන් කැඳවීමට සහ සියලු සාක්ෂිකරුවන්ට පැමිණ සිටින ලෙස බල කිරීමට;

(ආ) ලේඛන ඉදිරිපත් කරන ලෙස බල කිරීමට; සහ

(ඇ) සාක්ෂිකරුවන් ලවා යම් දිවුරුමක් දිවුරවීමට හෝ සහතික ප්‍රකාශයක් කරවීමට

මහෙස්ත්‍රාත් අධිකරණයක් සතු සියලු බලතල කොමසාරිස්වරයාට ඇත්තේ ය.

වැරදි.

10. (1) (අ) 9 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා කොමසාරිස්වරයාට අවහිර කරන්නා වූ හෝ බාධා පමුණුවන්නා වූ; හෝ

(ආ) යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් යම් නාම ලේඛනයක් හෝ වාර්තාවක් පිළියෙළ කරන්නා වූ හෝ පිළියෙළ කරනු ලැබීමට සලස්වන්නා වූ හෝ 9 වන වගන්තියෙන් පැවරී ඇති බලතල

යටතේ ක්‍රියා කරන කොමසාරිස්වරයාට එබඳු යම් නාම ලේඛනයක් හෝ වාර්තාවක් අසත්‍ය බව දැන දැනම ඉදිරිපත් කරන්නා වූ හෝ ඉදිරිපත් කරනු ලැබීමට සලස්වන්නා වූ හෝ දැන දැනම ඉදිරිපත් කරනු ලැබීමට ඉඩ දෙන්නා වූ; හෝ

(ඇ) යම් තොරතුරක් අසත්‍ය බව දැන දැනම කොම සාරිස්වරයා වෙත එය සපයන්නා වූ; හෝ

(ඈ) කොමසාරිස්වරයා විසින් දෙනු ලැබූ යම් විධානයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින්නා වූ; හෝ

(ඉ) මේ පනතේ යම් විධිවිධානයක් කඩ කරන්නා වූ සෑම තැනැත්තකු ම වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්ම වන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාර යෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් වන්නේ ය.

(2) පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්‍ෂවරයකු ම හෝ නිලධරයකු ම; නැතහොත්

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන පුද්ගල මණ්ඩල යක් නම් ඒ මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලබන්නේ ය:

එසේ වුව ද තමාගේ දැනීම නොමැතිව ඒ වරද සිදු කරනු ලැබූ බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීම පිණිස තමා නිසි සියලු උද්යෝග යෙන් ක්‍රියා කළ බව අධ්‍යක්‍ෂවරයකු, නිලධරයකු හෝ සාමාජිකයකු විසින් ඔප්පු කරනු ලැබුවහොත් එවැනි කිසිම අධ්‍යක්‍ෂවරයකු, නිලධරයකු හෝ සාමාජිකයකු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලබන්නේ ය.

11. මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් පවත් වනු ලබන යම් පරීක්ෂණයක කටයුතු, ඒ පරීක්ෂණයේ දී උද්ගත විය හැකි කාරණා සම්බන්ධයෙන් සාක්ෂි හෝ තොරතුරු එළිදරව් කර ගැනීම සඳහා මැනවින් යොදා ගනු ලැබිය හැකි යයි කොමසාරිස් වරයාට පෙනී යා හැකි ස්වාභාවික යුක්තියේ සිද්ධාන්තවලට අනනු කූල නොවන යම් ආකාරයකින්, කොමසාරිස්වරයා විසින් පවත්වනු ලැබිය හැකි ය. මේ පනතේ කාර්ය සඳහා කොමසාරිස්වරයා විසින් පරීක්ෂණ කටයුතු පැවැත්වීම.

දන්වීම භාර දීම.

**12.** යම් තැනැත්තකු වෙත හෝ යම් තැනැත්තකුට මේ පනතින් භාර දෙනු ලැබීමට හෝ දෙනු ලැබීමට නියම කරන ලද යම් දන්වීමක් ඒ තැනැත්තා වෙත හෝ ඒ තැනැත්තාට පෞද්ගලිකව භාර දෙනු නොලැබුව හොත් හෝ දෙනු නොලැබුව හොත්—

(අ) ඒ තැනැත්තාගේ සාමාන්‍ය හෝ අන්තිමට දැන සිටි පදිංචි හෝ ව්‍යාපාර ස්ථානයෙහි තබනු ලැබුව හොත් ; හෝ

(ආ) ඒ තැනැත්තාගේ සාමාන්‍ය හෝ අන්තිමට දැන සිටි පදිංචි හෝ ව්‍යාපාර ස්ථානයේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබුවහොත්

එය නිසි පරිදි භාර දෙනු ලැබුවේ යයි හෝ දෙනු ලැබුවේ යයි සලකනු ලැබිය යුතු ය.

මේ පනතේ විධිවිධාන වෙනත් නීතියක් අභිබවා බලපැවැත්විය යුතු බව.

**13.** වෙනත් යම් ලිඛිත නීතියක හෝ වාචික, ලිඛිත, ප්‍රකාශිත හෝ ගම්‍යමාන යම් සේවා නියුක්ති ගිවිසුමක හෝ කුමක් සඳහන්ව ඇත ද මේ පනතේ විධිවිධාන වලංගුව බලපැවැත්වෙන්නේ ය ; තව ද ඒ අනුව මේ පනතේ විධිවිධාන හෝ ඒ වෙනත් නීතිය හා ගිවිසුම් හෝ අතර යම් ගැටීමක් හෝ නොගැලපීමක් ඇති වූ විට ඒ වෙනත් නීතිය හෝ ගිවිසුම අභිබවා මේ පනතේ විධිවිධාන බලපැවැත්වෙන්නේ ය.

අර්ථ නිරූපණය.

**14.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මේ පනතෙහි—

"අත්කර ගැනීමේ නිලධරයා" යන්නෙහි (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"ඉඩම් අත්කර ගැනීමේ පනත" යන්නෙන් (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත අදහස් වේ;

"ඉඩම් ප්‍රතිසංස්කරණ පනත" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත අදහස් වේ;

"ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව" යන්නෙහි ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය;

"කම්කරුවා" යන්නෙන් වතු කම්කරු නාම ලේඛනයක නම් දැක්වෙන (සාමාන්‍යයෙන් ඉන්දියානු කුලීකරුවන් යනුවෙන් හඳුන්වනු ලබන) යම් කම්කරුවකු හෝ කන්කානියකු අදහස් වන අතර සාමාන්‍යයෙන් "කුලීකත්" යනුවෙන් හඳුන්වනු ලබන මුස්ලිම්වරු ද කම්කරුවකුව සිටීම අවසන් කළ යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ;

"කාර්මික ආරාවුල් පනත" යන්නෙන් (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත අදහස් වේ;

"කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු" යන්නෙන් කම්කරුවකු ලෙස නොව, වෙනත් යම් තත්ත්වයකින් වත්තක සේවයෙහි නියුක්ත යම් තැනැත්තෙක් අදහස් වන අතර කාර්ය මණ්ඩලයේ සාමාජිකයකුව සිටීම අවසන් කළ යම් තැනැත්තෙක් ද ඊට ඇතුළත් වේ;

"කොමසාරිස්වරයා" යන්නෙන් තත්කාලයෙහි කම්කරු කොමසාරිස් ධුරය දරන තැනැත්තා අදහස් වන අතර—

(අ) මේ පනතේ 7 වන සහ 8 වන වගන්ති නොවන වගන්ති යටතේ කොමසාරිස්වරයා සතු යම් බලයක්, කාර්යයක් හෝ කටයුත්තක් සම්බන්ධයෙන් වූ විට, ඒ බලය ක්‍රියාත්මක කිරීමට, ඒ කාර්යය ඉටු කිරීමට හෝ ඒ කටයුත්ත කිරීමට කොමසාරිස්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තෙක් ද ;

(ආ) මේ පනතේ 7 වන සහ 8 වන වගන්තිවලින් කොමසාරිස්වරයා වෙත පැවරී ඇති යම් බලයක් සම්බන්ධයෙන් වූ විට, තත්කාලයෙහි නියෝජ්‍ය හෝ ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර කම්කරු කොමසාරිස් ධුරය දරන්නා වූ යම් තැනැත්තෙක් හෝ යම් කම්කරු නිලධරයෙක් ද,

ඊට ඇතුළත් වෙති.

"පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවා" යන්නෙන් 1964 ඉන්දු - ලංකා ගිවිසුම යටතේ ඉන්දියානු පුරවැසියකු වශයෙන් ඉන්දියානු ආණ්ඩුව විසින් පිළිගනු ලැබූ තැනැත්තෙක් අදහස් වේ ;

"ප්‍රාග්ධන අරමුදල" යන්නෙන් ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රාග්ධන අරමුදල අදහස් වේ ;

"රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල" යන්නෙන් (437 වන අධිකාරය වූ) රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ පිහිටුවනු ලැබූ රබර් නැවත වගා කිරීමේ සහනාධාර අරමුදල අදහස් වේ ;

"වත්ත" යන්නෙහි (133 වන අධිකාරය වූ) වතු කම්කරු (ඉන්දියානු) ආඥාපනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"වෙනත් මූල්‍ය ප්‍රතිලාභ" යන්නට හිඟ වැටුප්, අර්ථ සාධක අරමුදලට ගෙවූ දායක මුදල් සහ වාර්ෂික නිවාඩු වැටුප් ඇතුළත් වේ ;

"සේවක අර්ථ සාධක අරමුදල" යන්නෙහි 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"සේවක අර්ථ සාධක අරමුදල් පනත" යන්නෙන් 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත අදහස් වේ :

"සේවායෝජකයා" යන්නෙන්—

(අ) යම් කම්කරුවකු හෝ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ සේවයෙහි නියුක්ත කර ගන්නා යම් තැනැත්තෙක් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් යම් කම්කරුවකු හෝ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු සේවයෙහි නියුක්ත කර ගනු ලබන්නේ යම් තැනැත්තකු වෙනුවෙන් ද ඒ තැනැත්තා අදහස් වේ; නැතහොත්

(ආ) යම් කම්කරුවකු හෝ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ වෙනත් යම් තැනැත්තකු වෙනුවෙන් සේවයෙහි නියුක්ත කර ගනු ලබන්නේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා අදහස් වන අතර ඊට සේවායෝජක මණ්ඩලයක් (ඒ මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක්, සමාගමක්, සංස්ථාවක් හෝ වෘත්තීය සමිතියක් වුව ද) සහ සේවායෝජකයකුව සිටීම අවසන් කළ යම් තැනැත්තකු හෝ සේවායෝජක මණ්ඩලයක් හෝ අදහස් වේ.

## උපලේඛනය

පෙරළා සියරට යවනු ලබන ඉන්දියානුවකුට මේ පනතේ 2 වන වගන්තිය යටතේ ගෙවිය යුතු පාරිතෝෂිකය පහත සඳහන් ගාස්තු ප්‍රමාණයන් අනුව ආගණනය කරනු ලැබිය යුතු ය:—

(1) කම්කරුවන්ට අදාළ ගාස්තු ප්‍රමාණයන්—

(අ) සේවක අර්ථ සාධක අරමුදලට ගෙවීමට යටත් වීම ආරම්භ වීමට පෙර සේවයෙහි නියුක්තව සිටි එක් එක් වර්ෂය සඳහා—

(i) පිරිමියකුට—රු. 35.00

(ii) ස්ත්‍රියකට—රු. 30.00

(ආ) සේවක අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවීමට යටත් වීම ආරම්භ වූ දින සිට 1970 දෙසැම්බර් මස 31 වන දින තෙක් සේවයෙහි නියුක්තව සිටි එක් එක් වර්ෂය සඳහා—

(i) පිරිමියකුට—රු. 17.50

(ii) ස්ත්‍රියකට—රු. 15.00

(2) කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට අදාළ ගාස්තු ප්‍රමාණයන්—

යම් අර්ථ සාධක අරමුදලකට සේවායෝජකයාගේ දායක මුදල එයින් අඩුකර, අවසාන වැටුප පදනම් කරගෙන සේවයෙහි නියුක්තව සිටි එක් එක් වර්ෂය සඳහා එක් මාසයක දළ වැටුප.